# මානව දයාව සොයා යන ගමනේ.......

හෙන්රි ඩී කුමාරප්පෙරුම
සිනුවර

කුසගිනි පහරන වේදනාව, දුක් කඳුලේ හදගැස්ම, පීඩිත පන්තියේ සුසුම් සිය දෘෂ්ඨියේ කම්පනයට එල්ලවූ ජීවනයේ ඇතුල් පැත්ත දැකිය හැකි වන්නේ සංවේදී හදවතක් ඇති මිනිසෙකුට පමණි. අනුන්ගේ විපත දෙස තුටු සිතින් හෝ උපේක්ෂාවෙන් දකින මිනිසුන් අතර පොදු ජන පීඩනයේ හද ගැස්ම සිය දර්ශනයට හසු කරගන්නා දයාද්‍රයෙක් වේද; ඒ නම් මිනිසත් කම හොඳින් ම හඳුනන සැබෑ ම වූ මනුෂ්‍යයෙකි. ඒ සැබෑ මනුෂ්‍යත්වය විසින් හඳුනාගනු ලබන ජීවිත යථාර්ථය ලොවට හෙළි කරලන අනුවේදනීය මාවත කුමක් විය යුතුද? එයට අපට දිය හැකි පිළිතුර මානව හිතවාදයෙන් උද්ගතවන පුද්ගලානුභූතියේ පන්හිඳ හරහා ගලා යන වදන් වැල සරසන මාවත හැර අන් කිමෙක්ද?

මෑතදී සිනුවරින් එළි දුටු 'සුදු වැලි' සංගත තැටියේ ගී රාවයෙන් මතුවන එබඳු සංවේදී පුද්ගලයකු අන්තර්ජාලයට එක්වෙන මේ මොහොතේ ඒ ඔස්සේ ඔහු ගැන දෝතක් වදන් ගෙන හැර පෑම මෙහි අරමුණයි. ඔහු දේශපාලනිකයෙක් නොව නියම දේශපාලනය හඳුනන්නෙකි. සැඟැවූ යටි අදහස් ඇත්තෙක් නොව විවෘතාකල්පයෙන් ඔදවැඩෙන්නෙකි. ඔහු රන් කහවනුවට වහල්නොවන්නෙකි. කහවනුවෙන් නිසි පල ලබන්නෙකි. වාසිය තකා නන්දොඩවන්නෙක් නොවේ. නිස්සාට වාසිය ලබා දෙන්නෙකි. කපටි බස් පිළිකෙව් කළ අයෙකි එහෙත් මනාව කපටි බස් හඳුනන්නෙකි. අත්තුක්කංසනයෙන් හා පරවම්භනයෙන් මිදී උදාර පෞරුෂයක් ගොඩනගා ගත්තෙකි. වෘත්තියෙන් නොකෙළසී වෘත්තියත් නොකෙළසා කිත් ගොසින් වැඩෙන්නෙකි. දෙස රැස බසට ආවැඩුමෙන් තොරව දෙස රැස බසට සම සිතින් වැඩ සදන්නෙකි. නිහතමානිත්වයේ සංකේතයකි. ලේඛන කලාවේ පෙර ගමන් කරුවෙකි. සුභාවිත ගීතයේ සළකුණ ලෙසින් මේ හඳුන්වා දෙන්නේ සිනුවර වාසී මෛත්‍රී පනාගොඩ නම් වූ උත්තම ගණයේ නීතිවේදී කලා කරුවා ගැන ය.

උපන් බිමේ වෙල් එළියේ දුවපැන ඇවිදි වියේ සිට ම ඇලෙන්, දොලෙන්, ගහෙන්, කොලෙන්, වෙල් එළියෙන්, ඉපනැල්ලෙන් ලැබූ ආශ්වාදයෙන් ඔහුගේ හද කිති කැවිණි. කඳු වැටියෙන්, මුදු සුළඟින්, වලා පෙළින්, විහඟ නදින් කුඩා හද ඇමතූ සොඳුරු හැඟුම් ජන මාධ්‍යය තුළ පත්ඉරුවෙන් ඉරුව වර්ණවත් කළේය.

නාඹර විය පසු කරද්දී දෙනෙත් වැදි සමාජ උස්මිටි කම්වල පරතරයෙන් සැලී ගිය හදින් වැඩිදෙනා නොදකින සමාජ පසුබිමක සාහිත්‍යයයක් ඔපවත් කළේය. ඒ හා සමග ම යදියාගේ, දුගියාගේ පමණක් නොව දරුවාගේ හා මහල්ලාගේ ඇතුලාන්තයේ කිඳා බැසි යථාර්ථය තුළට තම උල්පත් පෑන්තුඩ යොමු කළේය. ආදරයක, වියෝගයක හා පුරාඟනකගේ මනෝභාවයන් ප්‍රතිභා පූර්ණ කවි කල්පනාවන් බවට පත් කළේය. ගීයට සඳෙසට නිසඳැසට පණ පොවාලීම ඔබට වෙහෙසක් නොවීය. නිරායාසයෙන් ගලා ආ සුමුදු වදන් වැල වෙලා ගත්තේ ප්‍රබුද්ධයන් ම පමණක් නොවේ. හෙළ ලිවිසැරිය, සාහිත්‍යය, සංයමය ජනමාධ්‍යය ඔස්සේ පොදු ජන හදවත්හි හැමදා වහනය වන සුවඳක් බවට පත් කළේය.

උදයෙ හමුවන ඔබගෙ දෑසේ සරසවිය සැරි
සරනු දැක්කෙමි
කවියෙ නිජබිම රසයෙ උල්පත ඔබනිසා මම
සොයා ගත්තෙමි
නහර වැල්තුළ අමුතු මිහිරක් එකතු වෙන
හැටි සිහින දැක්කෙමි
හදේ මතුවුන ඒ හැඟුම මම 'ආදරය' යැයි
හැඳින ගත්තෙමි

'ඔබ සොයා' නම් කවි කිණිත්තෙන් 1968 දී සිළුමිණ 'කවි මුතු' හරහා සිය පළමු පැදි පෙළ තුළින් මැවූ හැඟුම් වල හැටි සිහි කරන විට නාඹර වියේ ආදරය සොයා යන අයකු සතු නොවූ අසාමාන්‍ය භාව සංකලණයක රසාලිප්තතාවය ඉන් මොනවට පැහැදිලි කර ඇත. හද්‍ර යෞවනයේදී සිය ලේ නහර ඔස්සේ ආදරය ගමන් කළ අයුරු නිරායාසයෙන් පාඨක හදවත් වැළඳ ගත්තේ එසේය.

1975 වකවානුව ඔබේ නැවුම් හැඟුම් රැසක් සඳෙස් කවි මගින් මිදී නව ආරේ නිසඳැස් මතින් බෙහෝ දෙනෙකුට නොපෙනෙන ජීවමාන ලොවක් ඇති බවත් එයට හිමිවිය යුතු මානව දයාවත් ගැඹුරට විග්‍රහ කළේ 'වසන්ත උද්‍යානයක් නොව' යන නිදහස් පැදි වැල් ගත තුළිණි. එහිදී ඉහළයාගෙන් පහළයා මහ මගදීත් පෙළෙන අයුරකින් සංකේතවත්වැ කියැවෙන කතාව හෙවත් පන්ති පරතරයේ කතාවේ අවසන ඔබ දක්වන්නේ මෙසේය.

එහෙත් මැතිඳ......
රථය නගන සිහින් හඬට
කන්දීලා බලනු මැනවි
එතකොට එය කියාදේවි
එය දුවන්නෙ
තෙල් පැට්‍රල් වලින් නොවේ
එයට හුස්ම පිඹින අපේ
දරුවන්ගේ කඳුළු වලින්
බිරියන්ගේ සුසුම් වලින්
අපේ දහඩියෙන් විත්තිය.

'අතර මගකදී' නිසඳැස් ගතේ නව ආරේ අදහස් ගොන්න පවතින සමාජ ක්‍රමයේ කලුවර පෙදෙසින් ජනිත කළේ පරතර ගත සමාජ ක්‍රමයේ සංශෝධනය අයදින මානව දයාවයි. එය ඔබට හිමි වූ නිසග කවිත්වයේ ඵලය රසිකයා වෙත ලබා දුන් අයුරුය.

ආනන්දයත් කොළඹ සරසවියත් නීති පර්ෂදයත් යන මේ තුන් තැනින් ලත් ඉගෙනුම් රටේ ජීවයට නිසි අරුතක් ලබාදීමට කළ වෑයමක් වැන්න. ඉන් නොනැවතී එංගලන්තය තව දුරටත් ඔබේ සංයමය මුවහත් කර ඇත. ප්‍රවීණ නීති වේදියෙක් ව ඕස්ට්‍රේලියාවට පැමිණියද දිවිමගේ ඔබ දමාගත් පදනම නොබිඳී නො කැඩී යන අයුරින් ස්ථාවරත්වයට පත් කරගෙන ඇත.

එපමණක් ම ද මවු රට හැර ගියත් ඔබේ විගාමික පිළිවෙත වෘතියේ සාකල්‍ය සාර්ථකත්වය මුදුන් පමුණුවා ගැන්මක් සේ අපි දකිමු. එමගින් නිවැරදි තීන්දු තීරණ හරහා පීඩිතයාට හෙවත් නිස්සාට ජය ලබාදීමට සත්‍යය සොයා සියලු වෙහෙස යෙදීම පිළිවෙත කරගති. ස්ව ජාතිකත්වය හා සංස්කෘතිකමය සීමා තුළින් ගරුත්වයට පත්වීම අභිමානනීයවේමැයි.

අන්තර්ජාලය වෙතින් විශ්ව ගම්මානයට කැඳවන ඔබට තව තවත් නව නිමැවුම් වෙනුවෙන් නිමේශයක ජය සතුට එක් කරමින් දිගු අනාගතයකට සිනුවර සිට සුබ පතමි.

ඔබ ගැන ලක් මවද මෙසේ පවසනු ඇත.

මම අළසව හිඳිමි පුතේ
නුඹ ළඟ නැති බව දැනිලා
රට හැර ගියමුත් පුතුනේ
මට ආඩම්බරය ගෙනේ

ඉසුරු සපිරි වසන දෙසේ
රන් කහවන සරත අතේ
මා ගැන පමණක් ම නොවේ
නූඹ නිති සළකා බැලුවේ
කහවනුවට නුහුරු බසට
අමතක නොම කර තෙරුවන
මගෙ අසරණ දරු දුක ගැන
නුඹෙ හද ගැහෙනව දැනෙනව

■




